*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 16-Iss. II, Dec. 2025, 70-86.*
DOI: https://doi.org/10.4038/p.v16i2.73

# අදින්නාදාන පාරාජිකා ආපත්තිය පිළිබඳ විමර්ශනයක්
# [An Analytical Study of the Adinnādāna Pārājika]

**Pahalagama Dhammika**[1]

**Abstract**

This research explores the traditional and modern interpretations of the Adinnādāna Pārājika rule within the Buddhist Vinaya, which prescribes expulsion from the monastic order for committing theft. The study begins with a textual examination of the Vinaya Piṭaka and its commentarial literature, including authoritative interpretations found in the Aṭṭhakathā and Ṭīkā. These sources clarify the doctrinal meaning of adinnādāna (taking what is not given) and its implications for the preservation of moral discipline within the monastic community. In addition to the traditional exegesis, the research also identifies and evaluates the perspectives of modern scholars, who analyze this rule from historical, ethical, and socio-cultural standpoints. Particular attention is given to how the notion of property, ownership, and morality in Buddhist monastic law intersects with contemporary legal systems and social values. By comparing the canonical and commentarial explanations with modern academic interpretations, the study highlights both points of continuity and areas of divergence in understanding.

**Keywards**: Adinnādāna Pārājika, Vinaya Piṭaka, Commentaries, Social and Legal, Interpretations, Buddhist Monastic Discipline

1. Senior Lecturer, Department of Buddhaist and Pali Studies, Bhiksu University of Sri Lanka.
E-mail: pdhammika@busl.ac.lk https://orcid.org/0009-0007-9424-037X

Received: 22 June 2025, Accepted revised version: 20 November 2025.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

උපසම්පදා භික්ෂුවක දිවිහිමියෙන් ආරක්ෂා කළ යුතු ගරුකාපත්ති සංඛ්‍යාවෙහි ගැණෙන ශික්ෂා පදයක් වශයෙන් දෙවැනි පාරාජිකාපත්තිය සඳහන් කළ හැකි ය. පාරාජිකපාළියෙහි 'දුතියපාරාජිකං' යනුවෙන් මෙම පාරාජිකාව නම් කොට තිබේ. මෙම ආපත්තිය අදින්නාදාන පාරාජිකාපත්තියයි. සම්පූර්ණ වශයෙන් උපසම්පදා භික්ෂුත්වය අහිමි වන ආපත්ති විශේෂයක් වශයෙන් පාරාජිකා හැඳින්විය හැකිය. ඡේද්‍යගාමිනී ආපත්ති කොටසට මෙය අයත් වන්නේ ඒ නිසාය. නොදුන් දෙයක් ගැනීම පදනම් වී මෙම ශික්ෂා පදය පනවා තිබේ. භික්ෂුවකට සොරකම් කිරීම සම්පූර්ණ වශයෙන් තහනම් වන්නේ මෙම ශික්ෂා පදය හේතු වෙනි. ගරුකාපත්ති ගණයෙහි ගැනෙන අදින්නාදාන පාරාජිකාවෙන් සිදු වන්නේ සීල විපත්තියයි.

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණය සිදුකෙරෙන්නේ අදින්නාදාන පාරාජිකාපත්තිය, අර්ථකථනය කිරීම, පැනවීම්, නිදානය, ඒ ආශ්‍රිත සංසිද්ධි හා නූතන භාවිතය පිළිබඳ විමර්ශනය කිරීමේ අරමුණිනය. එහි දී පරිශීලනය කරනු ලබන ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍රය බුද්ධ ජයන්ති ත්‍රිපිටක පාඨ, අට්ඨකථා හා ටීකා ග්‍රන්ථ, සහ නවතම විනය විවරණ සංග්‍රහයන්ය. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පාරාජිකපාළි (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2005) මෙම අධ්‍යයනයෙහි ප්‍රාථමික මූලාශ්‍රයයි. මෙම ග්‍රන්ථය පාරාජිකපාළිය භික්ෂු සංඝයා විසින් රැකිය යුතු ප්‍රමුඛ නෛතික සීමා විස්තරාත්මකව දක්වයි. එය ප්‍රාථමික මට්ටමින් අදින්නාදාන පාරාජිකාපත්තිය පිළිබඳ විවරණමය දෘෂ්ටියක් ලබා දෙයි. විනය පිටකයෙහි අර්ථ විවරණ සඳහා ප්‍රධාන අට්ඨකථා මූලාශ්‍රය වන්නේ සමන්තපාසාදිකාවයි. (හේවාවිතාරණ මුද්‍රණ, කොළඹ, 2014) ය. එය විනය විනිශ්චය ක්‍රම නිරූපණය කරමින්, අදින්නාදාන පාරාජිකාවට අදාළව අභිප්‍රේත අර්ථ විස්තරාත්මකව විවරණය කරයි. අට්ඨකථාව මත ගොඩනැගුණු විනය විග්‍රහ හා විවරණය විමතිවිනොදනී විනය ටීකාව (ලක්ෂ්මන් මුද්‍රණාලය, කොළඹ, 1935) හා සාරත්ථදීපනී විනය ටීකාව සපයයි. (විද්‍යාවිභූසන යන්ත්‍රාලය, 1914) පරිශීලනය කෙරේ. මෙම ටීකා විනය අර්ථ විවරණවල ගැඹුර හා විනය ක්‍රියාත්මක වීමේ ප්‍රායෝගික අරුත වඩාත් පැහැදිලි කරයි. එමඟින් අදින්නාදාන පාරාජිකාපත්තියට අදාළ අර්ථ දැක්වීම් හා තර්කික විශ්ලේෂණයකට ලක්කෙරේ. මෑතකාලීන විනය විවරණ ග්‍රන්ථ අතර, මහව ඤාණාලෝක හිමියන් විසින් සංග්‍රහ කරන ලද විනයත්ථදීපනී ප්‍රථම භාගය (මහාවිහාර පදනම, 2020) සාම්ප්‍රදායික විනය විවරණ හා නව විශ්ලේෂණාත්මක දෘෂ්ටිකෝණ එකට ගැළපූ ග්‍රන්ථයකි. මෙහි විනය නියමයන්ගේ අභ්‍යන්තර අර්ථ හා භික්ෂු ජීවිතයේ ප්‍රායෝගික අදාළතා විග්‍රහ කරයි. තවත් ප්‍රායෝගික හා නවතම මූලාශ්‍රයක් වශයෙන් පූජාපිටියේ සුරියරතන හිමියන් විසින් රචිත විනයවිනිශ්චය සංග්‍රහය ප්‍රථම භාගය (මහාවිහාරීය ශ්‍රාවක සංඝ සභාව, 2023) හඳුනා ගැනේ. අදින්නාදාන පාරාජිකාපත්ති විනිශ්චයෙහි අර්ථ දැක්වීම් හා විනයානුශාසනවල සාමාජීය හා නෛතික ප්‍රතිඵල එහි විග්‍රහ වේ. එමඟින් අදින්නාදාන පාරාජිකාපත්තිය නව පරම්පරාවකට අදාළ අර්ථ විවරණය වේ. ඉහත සඳහන් මූලාශ්‍රය පරිශීලනයෙන් පෙනී යන්නේ, අදින්නාදාන පාරාජිකාපත්තිය පිළිබඳ සම්ප්‍රදායික විවරණ හා නව විග්‍රහ අතර ගැඹුරු සම්බන්ධයක් පවතින බවය. බුද්ධ ජයන්ති ත්‍රිපිටකය මූලික ප්‍රඥප්තිය ලබාදෙන අතර සමන්තපාසාදිකා අට්ඨකථාව, විමතිවිනොදනී, සාරත්ථදීපනී ආදී ටීකා එම පදනම විවරණාත්මකව ඉදිරිපත් කර ඇත. තව ද විනයත්ථදීපනී සහ විනයවිනිශ්චය සංග්‍රහය නව විශ්ලේෂණාත්මක හා ප්‍රායෝගික අර්ථ දැක්වීම් ලබාදෙයි. ඒ අනුව, මෙම සියලු

මූලාශ්‍රය සංසන්දනය මඟින් විනයානුකූල අර්ථ විමර්ශනය කිරීමේ පදනම මෙම අධ්‍යයනට හසු කොට ඇත.

### පර්යේෂණ ගැටලුව

අදින්නාදානා පාරාජිකාපත්තිය පිළිබඳව සම්ප්‍රදායික විනය විවරණ හා නවීන සාමාජීය අර්ථ දැක්වීම් අතර එකඟතාව සහ පරස්පර විරෝධී ගැටලු පවතිනවාද? වර්තමාන සමාජයීය හා නීතිමය පරිසරය තුළ අදින්නාදානා පාරාජිකාපත්තිය තේරුම් ගැනීමේ අභියෝග මොනවාද? යන ගැටලුව පර්යේෂණ ගැටලුව වේ.

### පර්යේෂණ අරමුණු

#### ප්‍රධාන අරමුණ

අදින්නාදානා පාරාජිකාපත්තිය පිළිබඳ සාම්ප්‍රදායික හා නවීන අවබෝධය පර්යේෂණාත්මකව විමර්ශනය කිරීම.

#### උප අරමුණු

1. විනය පිටකය, අටුවා සහ ටීකා මගින් දක්වන අදින්නාදාන පාරාජිකා විවරණය කිරීම
2. නවීන පර්යේෂකයන්ගේ විග්‍රහ හා විමර්ශන හඳුනාගැනීම
3. සමාජයීය හා නීතිමය අර්ථ දැක්වීම හා අදින්නාදාන පාරාජිකාපත්තිය සමග ඇති සම්බන්ධතාව පරීක්ෂා කිරීම
4. අනාගත පර්යේෂණ සඳහා නව මාර්ගෝපදේශ ලබාදීම

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදු කරන ලද අධ්‍යයනයකි. දත්ත ලබා ගැනීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන ලදී. ප්‍රාථමික මූලාශ්‍රය ලෙසින් පාරාජිකපාළි, විනය අට්ඨකථාව, විනය ටීකා ආශ්‍රය කර ගත් අතර ද්විතීයික මූලාශ්‍රය වශයෙන් පර්යේෂණාත්මක කෘති ලිපි අධ්‍යයනය කරන ලදී. තොරතුරු විශ්ලේෂණයේ දී අධ්‍යයනයේ අරමුණුවලට අදාළව ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණය යටතේ තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

### පර්යේෂණයේ වැදගත්කම

අදින්නාදානා පාරාජිකාපත්තිය පිළිබඳ භික්ෂු විනයෙහි අනුදත් මූලධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත හැකිය. නවීන සමාජයේ ආගමික, නෛතික ගැටලු අවබෝධ කර ගැනීමට උපකාරී වේ. අනාගත ගවේෂණ සඳහා මූලික මගපෙන්වීමක් සපයයි. විනය අධ්‍යයනයේ නව දෘෂ්ටිකෝණ සහ ථෙරවාද විවරණය ඉස්මතු කොට ගැනීමට ද හැකිවේ.

### සාකච්ඡාව

අදින්නාදාන පාරාජිකාපත්තිය බුදුරදුන් විසින් භික්ෂු සංඝයා උදෙසා පනවා ඇති විනය ශික්ෂා අතර ප්‍රබල ශික්ෂාවක් වේ. අදින්නාදාන පාරාජිකාව සචිත්තක ශික්ෂා පදයකි. "අදින්නාදාන" යන වචනයෙන් අදහස් වන්නේ "නොදුන් දෙය ගැනීම" යන්නයි. එනම්, අනෙකුත් පුද්ගලයෙකුට අයිති වස්තුවක්, ඔහුගේ අවසරය නොමැතිව හෝ වංචාමය අයුරින් තමා සන්තක කර ගැනීමයි. මෙම ක්‍රියාව තුළින් උපසම්පදා භික්ෂුවකගේ ස්වකීය භික්ෂු භාවය අහෝසි වී යයි. පාරාජිකා ආපත්ති සතරෙන් එකක් වන අදින්නාදාන පාරාජිකාපත්තිය තුළින් සීලය, භික්ෂු සංඝයා තුළ විශ්වාසය, සත්‍යභාවය බිඳීමට ලක්වේ. භික්ෂු විනය තුළ මූලික ශික්ෂාවක් පමණක් නොව, නීතිමය හා සමාජීය අර්ථ අන්තර්ගත වේ. අදින්නාදාන පාරාජිකාපත්තියට යම් භික්ෂුවක් පත්වූයේ ද යන්න විනිශ්චය කිරීමෙහිලා බොහෝ කරුණු පිළිබඳ අවධානයෙන් බැලිය යුතු වේ.

## අදින්නාදාන

නොදුන් දෙය අදින්න නම් වේ. අයිතිය අතහැර නොදුන් වස්තුව අදින්න නම් වේ. (Pali English Dictionary, 1925, p. 26). සංස්කෘත භාෂාවෙන් අදත්ත යනුවෙන් දැක්වෙන්නේ නොදුන් දෙයයි. (ශබ්දකල්පද්‍රැම ස, කන්තදේව, 1967, පි. 31) අදින්න සහ ආදාන යන දෙපදය එක් වී අදින්නාදාන යනුවෙන් පද සිද්ධිය වී ඇත. ආදාන පදය සකස් වී ඇත්තේ දා (දානෙ) දීම (Apte, 1985, පි. 495) යන්නට අකාරයක් එකතු වී සමාස වීමෙනි. එයින් නැත යන අර්ථය ප්‍රකාශ වේ. න + දාන - ආදාන හිමියා විසින් නොදුන් දෙය ගැණීම, හොරකම (සොරත හිමි, 1952, පි. 44). අන්සතු දේ ගැනීම මෙයින් අර්ථවත් වේ. සොර සිත මුල් වීම නිසා අදින්නාදාන යනුවෙන් මෙම පාරාජිකාව හඳුන්වයි. ''අදින්නං නාමං යං අදින්නං අනිස්සට්ඨං අපරිච්චත්තං රක්ඛිතං ගොපිතං මමායිතං පරපරිග්ගහිතං. එතං අදින්නං නාම'' (පාරාජිකපාළි, 2005, පි. 104). ථෙය්‍යචිත්තො අදින්නාදානපරාජිකං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා iv, 1948, පි. 1034). adinnaṃ: what has not been given, that which is not given (Bhikkhu Ñāṇatusita, 2014, p. 26). දෙවන පාරාජිකාපත්තියට අදාළ පද භාජනියෙහි 'අදින්න' යන්න පද හයකින් විස්තර කරයි. අත්තනො හත්ථතො වා යථා ඨිතට්ඨානකො වා න නිස්සට්ඨං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා i, 2014, පි. 216). තමාගේ අතින් හෝ තිබුණු ස්ථානයෙන් ඉවත් කොට නැති දෑ මෙයින් හඳුන්වයි. එනම් නොදුන් දෙය යන්න එයින් ගම්‍ය වේ. අපරිච්චත්ත යනුවෙන් හඳුන්වන්නේ යථාඨානෙ ඨිතම්පි අනපෙක්ඛතාය න පරිච්චත්තිතන්ති (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා i, 2014, පි. 216). යම් භාණ්ඩක් යම් ස්ථානයක තිබුණත් එහි අයිතිය අතනොහැර ඇත. එකී භාණ්ඩය අපරිච්චත්ත නම් වේ. එය ගන්නේ නම් අදින්නාදාන නම් වේ. රක්ඛිතං යනුවෙන් දැක්වෙන්නේ ආරක්ඛසංවිධානෙන රක්ඛිතත්තා රක්ඛිතං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා i, 2014, පි. 216). යම් භාණ්ඩක් විනාශවීම වැලැක්වීම සඳහා යම් ආරක්ෂාවක් සම්පාදනය කොට ඇත්නම් එය රක්ඛිත භාණ්ඩයකි. එය ගැනීම අදින්නාදාන නම් වේ. ගොපිතං යනුවෙන් දැක්වෙන්නේ මඤ්ජුස්සාදීසු පක්ඛිපිත්වා ගොපිතත්තා ගොපිතං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා i, 2014, පි. 216) යම් ආරක්ෂා ස්ථානයක තැම්පත් කොට ඇති භාණ්ඩය ගෝපිත නම් වේ. එයත් ගැනීම අදින්නාදාන නම් වේ. මමායිතං යනුවෙන් මෙහි දැක්වෙන්නේ මම ඉදන්ති තණ්හාමමත්තෙන මමායිතත්තා මමායිතං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා i, 2014, පි. 216) යම් භාණ්ඩක් කෙරෙහි ආශාවෙන් ආරක්ෂා කරන්නේ නම් එබඳු භාණ්ඩ ගැනීම අදින්නාදාන නම් වේ. පරපරිග්ගහිත යනුවෙන් දැක්වෙන්නේ තාහි අපරිච්චාගරක්ඛණගොපනෙහි තෙහි භණ්ඩසාමිකෙහි පරෙහි පරිග්ගහිතන්ති පරපරිග්ගහිතං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා i, 2014, පි. 216) යම් කෙනෙකු විසින් තමා සතුව තබාගෙන සිටින භාණ්ඩ පරපරිග්ගහිත නම් වේ. පරපරිග්ගහිතය ගැනීමත් අදින්නාදාන නම් වේ. මෙම වචන හයෙන් ම ප්‍රකාශ වන්නේ අන්‍යයන් සතු භාණ්ඩ හෝ වස්තුව යන්නයි. එනම් නොදුන් දේ යන්නයි. අන්‍යයන්ට අයත් වස්තුව ගැනීමේ දී සොර සිත ප්‍රධාන කාරණය වේ. එය ථෙය්‍ය චිත්තය නමින් හඳුන්වයි. ථෙය්‍යචිත්තො අදින්නාදානපරාජිකං (විනයට්ඨකථා නාම සමන්තපාසාදිකා iv, 1948, පි. 1034). සාමණේර හා උපසම්පදා භික්ෂූන්ට පාරාජිකා වර්ග දෙකකි. සාමණෙරානමුපසම්පන්නානඤ්ච අදින්නාදානපාරාජිකවත්ථුම්හි කො විසෙසො'ති පුච්ඡං කත්වා 'සාමණෙරානං දසිකසුත්තෙනාපි පාරාජිකො හොති,

උපසම්පන්නානං පන සුවණ්ණස්ස වීසතිවීහිමත්තෙනා'ති (විනයවිනිච්ඡය ටීකා, 1914) සාමණේර භික්ෂුවට නූල් පටක් හෝ සොර සිතින් ගැනීම පාරාජිකා වේ. උපසම්පදා භික්ෂුවට සොරා ගත් භාණ්ඩයේ වටිනාකම අනුව අදාළ ආපත්තිය සිදු වේ. යම් භාණ්ඩයක් පරිත්‍යාග නොකළ කල්හි ද අයිතිකරු එකී භාණ්ඩ තමාට අයිති බව නොදන්නා කල්හි ද එබඳු භාණ්ඩයක් සොර සිතින් ගැනීමෙන් අදින්නාදානය සිදු වේ. ඒ බව ටීකාවෙහි පරිච්චාගාදිම්හි අකතෙ ඉදං මය්හං සන්තිකන්ති වත්ථුසාමිනා අවිදිතම්පි පරිග්ගහිතමෙව බාලුම්මත්තකාදීනං සන්තකං විය (විමතිවිනොදනී, 1935, පි. 145). මාතාපිතුනං අච්චයෙන මන්දානං උත්තානසෙය්‍යකානං දාරකානං සන්තම්ව (සාරත්ථදීපනී i, 1914, පි. 496). කුඩා දරුවෙකුට අයිති යම් භාණ්ඩයක් හෝ දේපළක් මෙයින් අදහස් වේ. ළදරුවකුට අයත් වූ දෙයක් පිළිබඳ ඔහු අවබෝධයක් ඇති වන්නේ නැත. එබඳු දෙයක් වුවද සොර සිතින් ගැනීම අදින්නාදානයට අයත් වේ. උදාරහණයක් වශයෙන් දෙමාපිය අභාවය නිසා ළදරුවාට හිමි විය යුතු වස්තුව මෙයින් කියවේ. එකී වස්තුව හෝ දේපළ පිළිබඳ කුඩා දරුවෙකුට අයිතියක් පිළිබඳ අදහසක් නොපවතී. එබඳු දෑ වුවත් සොර සිතින් ගැනීම පාරාජිකාපත්තියට හේතු වේ.

### මූලපඤ්ඤත්තිය සහ අනුපඤ්ඤත්තිය

කුම්භකාර පුත්‍ර ධනිය භික්ෂුව මගධ සේනාපති වූ බිම්බිසාර රජුගේ භාණ්ඩාගාරයෙන් දැව ගැනීම හේතු කොට ගෙන මූල පඤ්ඤත්තිය පනවා තිබේ. බුදුරදුන් ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වාසය කරන කාලයෙහි බොහෝ භික්ෂූන් වහන්සේ තණ කුටි සකස් කොට ගෙන වස් එළඹුණහ. ධනිය හිමියන් ද තණ කුටියක් සකස් කොට ගෙන වස් එළඹුනේය. අනෙක් භික්ෂූන් වහන්සේ වස් කාලය ඉක්මී ගිය පසු තණ කුටි බිඳදමා ඒ සඳහා භාවිත කළ දෑ තැම්පත් කොට එම ස්ථානයෙන් නික්මී ගියහ. ධනිය හිමියන් එම ස්ථානයෙහි නැවතී සිටියේ ය. එහි දී තණ කුටි තුනක් ද මැටියෙන් (සබ්බමත්තිකා) කළ කුටියක් ද ලීයෙන් කළ කුටියක් කිරීමට සිදු විය. ධනිය හිමියන් මූලික කොට දෙවැනි පාරාජිකාව පැනවීම සිදු වන්නේ රාජ්‍ය භාණ්ඩාගාරයෙන් දැව ලබාගෙන පස්වන කුටිය කිරීම නිසාය. ඒ අනුව, "යො පන භික්ඛු ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසීති. තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො" (පාරාජිකපාළි, 2005, පි. 94). යම් මහණෙක් ගමකින් හෝ අරණ්‍යයකින් හෝ හිමියන් විසින් නුදුන් වස්තුවක් සොර සිතින් ගනී ද, යම්බඳු සොරකමක් නිසා රජහු සොරා අල්ලා ඔහුට පහර දෙත් ද බඳිත් ද රටින් නෙරපත් ද නුඹ සොරෙකි බාලයෙකි මුළාවූවෙකි අන්සතු දෑ සඟවා ගන්නෙකැ යි නින්දා කෙරෙත් ද, එබඳු සොරකමක් කරන්නා වූ මහණ පාරාජිකා වේ. භික්ෂූන් සමග සංවාස නැත්තේ වේ. මේ ශික්ෂා පදය මූලිකව දේශනා කළ ආකාරයයි. එය මූලපඤ්ඤත්තිය නම් වේ. ඡබ්බග්ගිය භික්ෂූන් රෙදි සෝදන ස්ථානයෙන් රෙදි සොරකම් කිරීම හේතු කොටගෙන අනුපඤ්ඤත්තිය පනවා තිබේ. ගාමා වා අරඤ්ඤා වා (පාරාජිකපාළි, 2005, පි. 104). අනුපඤ්ඤත්තියෙන් සොරකම් කිරීමේ ස්ථානයෙහි සීමාව දැක්වේ. මූල පඤ්ඤත්තියට අනුපඤ්ඤත්තිය එක් වූ විට අදින්නාදාන පාරාජිකාව සම්පූර්ණ වී ඇත.

### සර, සරූපචාර, ගාම, ගමූපචාර හා අරඤ්ඤ

මෙම පාරාජිකාපත්තියේ සර, සරූපචාර, ගාම, ගාමූපචාර හා අරඤ්ඤ යන වචනවල එනම් ඒ ඒ ස්ථානවල සීමාව නිවැරදිව දැනගැනීම අවශ්‍ය වේ. පාරාජිකපාළියෙහි ගාම, ගාමූපචාර හා අරඤ්ඤ යන ස්ථාන දක්වා

ඇතිමුත් අට්ඨකථා හා ටීකා ආධාරයෙන් සර හා සරූපචාර යන ස්ථාන පිළිබඳ අධ්‍යයනය කළ යුතුය. සර නම් ගෙය වේ. ගෙදර පියස්සෙන් වතුර වැටෙන ස්ථානයේ ඇතුළත සර නම් වේ. සරූපචාරය වටේ වටකොට නැති ''අපරික්ඛිත්ත'' සරසීමාවේ සිට සුප්පපාතයක දුරයයි. ගෘහය වටේ වටකොට ඇති ''පරික්ඛිත්ත'' නම් ඒ පරික්ෂේපය සරූපචාරය වේ. සරූපචාරයේ සිට ලෙඩ්ඩුපාතයක දුර ගම නම් වේ. ''ගාමො නාම එකකුටිකොපි ගාමො, ද්විකුටිකොපි ගාමො, තිකුටිකොපි ගාමො, චතුකුටිකොපි ගාමො, සමනුස්සොපි ගාමො, අමනුස්සොපි ගාමො, පරික්ඛිත්තොපි ගාමො, අපරික්ඛිත්තොපි ගාමො, ගොනිසාදිනිවිට්ඨොපි ගාමො, යොපි සත්ථො අතිරෙකචතුමාසනිවිට්ඨො සො වුච්චති ගාමො'' (පාරාජිකපාළි, 2005, පි. 104) එක ගෙයක් දෙකක් තුනක් හතරක් වශයෙන් ගෙවල් පිහිටා ඇත්තේ නම් ගම නම් වේ. මිනිසුන් ඇත්තේ ගමය. මිනිසුන් රහිත වූයේ ගමය. ගම වටකොට ඇත්තේ හෝ එසේ වටකොට නැත්තේ වුවත් ගමය. ගාමූපචාරය නම් ''ගාමූපචාරො නාම පරික්ඛිත්තස්ස ගාමස්ස ඉන්දඛීලෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො, අපරික්ඛිත්තස්ස ගාමස්ස සරූපචාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො.'' (පාරාජිකපාළි, 2005, පි. 104) අරඤ්ඤ නම් ''අරඤ්ඤං නාම ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච අවසෙසං අරඤ්ඤං නාම.'' (පාරාජිකපාළා, 2005, පි. 104)

ගමත් ගාමූපචාරයක් හැර ඉතිරි ස්ථානය අරඤ්ඤය නම් වේ. අදින්නාදාන පාරාජිකාවට අදාළව අනුපඤ්ඤත්තියේ දී ස්ථානීය සීමා පනවා තිබේ.

### වොහාරිකභික්ඛු හා පාදයේ වටිනාකම

අදින්නාදානා පාරාජිකාවට වස්තු වන දෙය එනම් සොරෙන් ගත් වස්තුවෙහි වටිනාකම පිළිබඳ සාකච්ඡාව පැන නගින්නේ මෙසේය. බිම්බිසාර රජු සොරෙකු අල්ලාගෙන ඔහුට දඬුවම් කරන්නේ කොපමණකින්ද? යන ප්‍රශ්නය පුරාණවොහාරික භික්ෂුවගෙන් බුදුරදුන් විමසා සිටියේය. එවිට පුරාණවොහාරික භික්ෂුව ප්‍රකාශ කරන්නේ "පාදෙන වා භගවා පාදාරහෙන වා" (පාරාජිකපාළි, 2005, පි. 102). දෙවැනි පාරාජිකාවට පාරාජිකා වස්තුව තීරණය වන්නේ එකල මගධ රාජ්‍යයෙහි ක්‍රියාත්මක වූ වටිනාම මතය. ඒ සඳහා පුරාණවොහාරික භික්ෂුව ක්‍රියාත්මකවීම මෙහි දී වැදගත් වේ. ''පුරාණවොහාරිකොති මහාමත්තොති භික්ඛුභාවතො පුරාණෙ ගිහිකාලෙ විනිච්ඡයවොහාරෙ නියුත්තා වොහාරිකොති සඞ්ඛං ගතො මහා අමච්චො' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා i, 2014, පි. 213). බිම්බිසාර රජුගේ රාජ්‍යයෙහි ගිහි කාලයෙහි විනිශ්චයස්ථානයෙහි ක්‍රියාත්මක වූ මහා අමාත්‍ය වරයෙකි. පුරාණ යන්නෙන් පෙර යනාර්ථය කියවේ. (Apte.V.S. 1985, p. 625). සංස්කෘත කෝෂයන්හි ද පුරාණ යන්නට පෙර යන අදහස දී තිබේ (වාචස්පත්‍යම් iv, 1962, පි. 4369). එනම් පැවිදිවීමට පෙර මින් අදහස් වේ. ගිහි කාලයයි. වොහාරික යන්නෙහි විනිසුරු යන අදහස කියවේ (අරියවිමල හිමි, තල්දෙන සහ විමලවංශ සූරිය, අයි. බී. 2023, පි, 642). සොරකමට පාදයක් හෝ පාදයක් අගනා වස්තුව ප්‍රමාණවත් බව ප්‍රකාශ කළේ පැවිදිවීමට පෙර ගිහි කාලයේ විනිශ්චය කාර්යෙහි ක්‍රියාත්මක වූ අයෙකි. ඒ නිසා එම භික්ෂුව වොහාරික භික්ෂු යනුවෙන් යොදා තිබේ. උන්වහන්සේගේ ප්‍රකාශය දෙවන පාරාජිකාවේ පාරාජිකා වස්තුව බවට පත්වී තිබේ. බුදුරදුන් වෝහාරික භික්ෂුවගෙන් සොරකමක් සඳහා දඬුවම් ලැබීමට එහි වටිනාකම විමසා සිටියේ ලෝක ව්‍යවහාරයත් අතීත බුදුවරුන් මෙපමණකින් පාරාජිකා මෙපමණකින් ථුල්ලච්චය මෙපමණකින් දුක්කට වන බවට සිදු කොට තිබූ පැනවීම් දැන ගෙනය. එසේ වුවත්

ලෝක ව්‍යවහාරයෙහි සර්ව සාධාරණත්වය පෙන්වාදීමට බව විනයට්ඨකථාව දක්වයි (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා i, 2014, පි. 213).

අදින්නාදාන පාරාජිකා වස්තුව පිළිබඳ පාරාජිකපාළියෙහි දක්වා ඇත්තේ පාදය හෝ පාදයක් අගනා වස්තුව සොර සිතින් ගැනීම පාරාජිකා බවයි. යථාරූපං වා පාදං වා පාදාරහං වා අතිරෙක පාදං වා (පාරාජිකපාළි, 2005, පි. 104). පාදය යනුවෙන් ඇති වස්තුවෙහි ස්වභාවය ''පඤ්චමාසකො පාදොති තදා රාජගහෙ වීසතිමාසකො කහාපණො හොති තස්මා පඤ්චමාසකො පාදො. තස්මා එතෙන ලක්ඛණෙන සබ්බජනපදෙසු කහාපණස්ස චතුත්ථො භාගො පාදොති වෙදිතබ්බො'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා i, 2014, පි. 213). කහාපණ යන නම ව්‍යවහාර කරන කාසියෙන් සතරින් එක කොටසකටක් "පාදය" කි. ඒ පාදය මසු පසකි. මේ සිකපදය පනවන ලද්දේ රජගහනුවරදී ය. එබැවින් මේ පාදය ගණන් ගනු ලබන්නේ එකල රජගහනුවර භාවිත කළ මංචාඩි විස්සක් බර ඇති කහවණුවෙනි.

එකල පාද නමින් කාසියක් තිබූ බව දැක්වේ (Childers, R.C. 1875, 315p). කහාපණයක හතරින් කොටසක් පාදයක් වන බව පවසයි (Rhys devids, T.W. 2005, 3p). එකල භාවිත වූ කහවණුවක හතරින් කොටසක් අදින්නාදාන පාරාජිකාව සඳහා පාරාජික වස්තුව වශයෙන් ගැනීම පෙළ, අට්ඨකථා, ටීකා හා නූතන විද්වතුන්ගේ අදහස් අනුව නිශ්චිත වශයෙන් ගැනීම සාධාරණ වේ.

### නීලකහාපණ

විනය අටුවාවෙහි පෞරාණික නීලකහාපණය යනුවෙන් එකල භාවිත වූ කහවණු දක්වා තිබේ. ඒ කහවණුව සාරත්ථදීපනී නම් වූ විනය ටීකාවෙහි විස්තර කර ඇත්තේ "පොරාණසත්ථානුරූපං උප්පාදිතො වීසතිමාසප්පමාණ උත්තම-සුවණ්ණග්ඝනකෙලක්ඛණසම්පන්නො නීලකහාපණො" (සාරත්ථදීපනී ii, 1914, පි, 493). පැරණි ශාස්ත්‍රයට අනුකූලව පිරිසිදු රත්තරනින් රාජ මුද්‍රාදී සහිතව නිපදවන ලද මංචාඩි විස්සක් බර ඇති රන්කාසියකි. පැරණි ශාස්ත්‍රයට නීලකහාපණය නිපදවීම සඳහා ''පඤ්චමාසා සුවණ්ණස්සා තථා රජතස්ස දසමාසා තම්බස්සාති, එතො වීසති මාසෙ මිස්සෙත්වා බන්ධනත්ථාය වීහිමත්තං ලොහානං පක්ඛිපිත්වා අක්ඛරානි ච හත්ථී ආදීනමඤ්ඤතරඤ්ච රූපං දස්සෙත්වා කතො නිද්දොසත්තා නීලකහාපණො නාම හොති'' (විනයවිනිච්ඡයටීකා පි, 598). රත්තරන් මංචාඩි පහක් ද රිදී මංචාඩි පහක් ද තඹ මංචාඩි දහයක් ද වී ඇටයක් පමණ ලෝහ ද මිශ්‍ර කොට අක්ෂර ඇත් රූප ආදිය සහිතව නිපදවන්නේ නීලකහාපණයයි. මෙම නීලකහාපණයෙන් හතරින් එකක් පාදයකි. එනම් රත්තරන් මංචාඩි පහකි. රුද්‍රදාමය යනුවෙන් ද විනිමය ව්‍යවහාරයක් එකල භාරතයේ භාවිත වූ බව පෙනෙයි. ''රුද්‍රදාමෙන උප්පාදිතො රුද්‍රදාමකො, සො කිර නීලකහාපණස්ස තිභාගං අග්ඝති.'' (සාරත්ථදීපනී ii, පි, 1914, 493). රුද්‍රදාමය නීලකහාපණයෙන් තුනෙන් එකකි. රුද්‍රදාමෙන යන වචනය තතියා ඒකවචනාන්ත බැවින් කවරෙකු හෝ කුමක විසින් සකස් කළ යන අදහස ගත හැකිය. ''රුද්‍රදාමෙන නාම කෙනචි උප්පාදිතො රුද්‍රදාමකො'' (විමතිවිනොදනී, 1935, පි, 143). විමතිවිනොදනී ටීකාවේ 'කෙනචි' යන ව්‍යවහාරයෙන් පෙනෙන්නේ කිසිවකු විසින් නිපද වූ බවයි.

රත්තරන් කාලානුරූපීව වෙනස් වන බැවින් ලංකාවේ ව්‍යවහාර කරන මුදලින් එය කොපමණක් ද යන බව කාලය අනුව විනිශ්චය කළ යුතුය. 2025.10.24 දින ශ්‍රී ලංකාවේ කැරට් 24 රත්තරන් පවුමක මිළ රුපියල් 353.050.00 (තුන් ලක්ෂ පනස් තුන්දහස් පනහකි) වර්තමානයෙහි රත්තරන් මිලි ග්‍රෑම් 285 මංචාඩි 01 කි. ග්‍රෑම් 08ක් පවුම් 01කි. රත්තරන් පවුමක බර මංචාඩි

28.5කි. මෙය ආසන්න වශයෙන් රත්තරන් පවුමක බර මංචාඩි 28 වශයෙන් ගත් විට රත්තරන් මංචාඩි 01 වටිනාකම සේවීම සඳහා ආසන්න වශයෙන් 28 බෙදිය යුතුය. එවිට ආසන්න වශයෙන් පර්යේෂණය වූ දිනයට රත්තරන් මංචාඩියක වටිනාකම රුපියල් වලින් ගණනය කළ හැකිය.

රත්තරන් පවුම් 01 මිළ රුපියල් 353050.00

මංචාඩි 01 මිළ 35305028 = රුපියල් 12609.00

මංචාඩි 05 ක මිළ රුපියල් 12609.00 × 5 = රුපියල් 63045.00

පාදයේ වටිනාම රුපියල් 63045.00

වර්තමානයේ ශ්‍රී ලංකාවේ භාවිත වන මුදල් ඒකය වන්නේ (LKR) වලිනි. මේ අනුව පැහැදිලි වන්නේ අදින්නාදාන පාරාජිකාව විනිශ්චයෙහිලා සොරකම සිදු වූ දේශයේ භාවිත මුදල් ඒකකය අනුව එදිනට මුදලේ වටිනාකම ගණනය කළ යුතු බව ඉහත අර්ථකථන විවරණවල අනුව හඳුනාගත හැකි බවයි.

**පස් විසි අවහාර ක්‍රමය**

සොරකම පිළිබඳ පාරාජිකපාළියෙහි දක්වන ලද අනිස්සට්ඨං, අපරිච්චත්තං, රක්ඛිතං, ගොපිතං, මමායිතං, පරපරිග්ගහිතං, වචන හය සමෝධානය කොට පස් විසි අවහාර ක්‍රමය දක්වා තිබේ. ''අපි ච ඡ ඉමානි පදානි වණ්ණෙන්තෙන පඤ්ච පඤ්චකෙ සමොධානෙත්වා පඤ්චවීසති අවහාරා දස්සෙන්තො'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 218). පඤ්ච පඤ්චක වශයෙන් ගෙන කොටස් වශයෙන් බෙදා ඇතිමුත් අර්ථ වශයෙන් බෙදා නැත.

| අගය | මුදල රුපියල් | ආපත්තිය |
|---|---|---|
| මංචාඩි 01 ට අඩු | 12609.00 | දුක්කට |
| මංචාඩි 01 හෝ ඊට වැඩි මංචාඩි 05 අඩු | 12609.00 - 63045ග00 | ථුල්ලච්චය |
| මංචාඩි 05 හෝ ඊට වැඩි | 63045.00 | පාරාජිකා |

ලෝකයේ භාවිත මුදල් ඒකක ඔස්සේ මෙම ගණනය සිදු කළ හැකිය. වර්තමානයේ බොහෝ සෙයින් භාවිත වන (USD) මුදල් ඒකකයෙන් බැලූ විට 2025.10.25 දින ඇමරිකන් ඩොලරයක වටිනාකම රුපියල් 303 කි. කැරට් 24 රන්පවුමක මිළ ආසන්න වශයෙන් USD 1162කි.

රත්තරන් පවුම් 01 මිළ USD 1162

මංචාඩි 01 මිළ USD 116228 = USD 41.5

මංචාඩි 05 ක මිළ USD 41.5 × 5 = USD 207.5

පාදයේ වටිනාකම USD 207.5

''වචනභෙදෙන භින්නා අත්ථතො අභින්නා'' (විමතිවිනෝදනී, 1935, පි. ). පහේ කොටස් පහක එකතුව විසිපහක් වේ. අදින්නාදානා පාරාජිකා ආපත්තිය සිදුකිරීමේ ක්‍රම 25ක් විනයෙහි දක්වා ඇත. විසි පස් අවහාර ක්‍රම අතුරෙන් කිනම් ආකාරයකින් වුව ද පාදයක් අගනා අන් සතු දෙයක් ගත හොත් පරිජි වේ. එකී සොරකම් කිරීමේ ක්‍රම අවහාර ක්‍රම වශයෙන් හඳුන්වයි. එකී අවහාර ක්‍රම 25 මූලික වශයෙන් ප්‍රධාන කොටස් පහකට බෙදෙයි. එනම්,

01. නානාභණ්ඩ පඤ්චකය

02. ඒකභණ්ඩ පඤ්චකය

03. සාහත්ථික පඤ්චකය

04. පුබ්බපයෝග පඤ්චකය

05. ථෙය්‍යාවහාර පඤ්චකය වශයෙනි.

**නානාභණ්ඩ පඤ්චකය**

නානාභණ්ඩ පඤ්චකය සවිඤ්ඤාණික හෝ අවිඤ්ඤාණික යන ආකාරය දෙකින් ම සිදු වන සොරකම පිළිබඳ විනිශ්චයට පත්විය හැකි ක්‍රම පහක් දැක්වේ. ඒ සඳහා ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානා චාවෙය්‍ය යන අවස්ථා ඔස්සේ මෙම නානාභණ්ඩ පඤ්චකය තුළ කරුණු අන්තර්ගත වී පවතී.

**01. අන් සතු වස්තුව නඩු කියා අයිති කර ගැනීමය (ආදියෙය්‍ය)**

තමාට අයත් නොවූ වස්තුව බොරු නඩු කියා අත්පත් කරගැනීම මෙයින් අදහස් වේ. එය නීති මාර්ගයෙන් හෝ වෙනත් මාර්ග යකින් අන්සතු වස්තුවක් අනිසි ලෙස ලබා ගැනීමයි. අන්සතු වස්තුව තමා සතු යැයි කීම දුක්කට වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). වස්තුවේ අයිතිකරුට ස්වකීය වස්තුවේ හිමිකාරිත්වය පිළිබඳ සැක ඇතිවීමෙන් ව්‍යාජ ලෙස වස්තුව අයිතිකර ගැනීමට ප්‍රයත්න දරන්නාට ථුල්ලච්චය වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). අයිතිකරු ස්වකීය වස්තුව පිළිබඳ හිමිකාරිත්වය විවිධ කාරණා ඔස්සේ අත්හරීනම් (ධුරනික්ඛේප) පාරාජිකාපත්තියට පත්වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, පි. 219, 2014).

**02. තමා විසින් ගෙන යමින් සිටියදී සොරසිතින් ගැනීමය (හරෙය්‍ය)**

අන්සතු වස්තුවක් රැගෙන යාමේ දී සිදු විය හැකි ආපත්තිය මෙහි දී දැක්වේ. යම් වස්තුවක් හිමියාගෙන් ඉල්ලාගෙන එය රැගෙන යාමේ දී සොර සිතින් ගැනීම මෙම අවහාර තුළ විස්තර වේ. හිසේ තබාගෙන යන වස්තුවක් නම් සොර සිතින් එකී වස්තුව අතගෑම දුක්කට වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, පි. 219, 2014). සොරකම් කිරීමේ අදහස ඇතිව වස්තුව සෙලවීම ථුල්ලච්චය වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). තිබෙන ස්ථානයේදී ම නො ඔසවා සෙලවීම මෙහි අදහස වේ. හිසින් එසවීම පාරාජිකා වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). වස්තුව හිස මත හෝ කර මත තබාගෙන යන්නේ නම් හිසින් හෝ කරෙන් එසවීමේ ක්ෂණයේ දී මෙම ආපත්තිය සිදු වේ.

**03. තමා වෙත පරෙස්සමට තැබූ දෙය නො දී ගැනීමය (අවහරෙය්‍ය)**

යම් වස්තුවක් විශ්වාසයෙන් ආරක්ෂාව සඳහා තබා එය ඉල්ලූ කල නොදීමෙන් මෙම අවහාරය සිදු වේ. අයිතිකරු ඉල්ලා සිටි අවස්ථාවේ මා එබන්දක් ගත්තේ නැත. ගත් බව මතක නැත. දැන් සෙවීමට අපහසුය ආදි ප්‍රයෝගයෙන් දුක්කට වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). වස්තු හිමියාට ස්වකීය වස්තුව දෙයි ද? නොදෙයිද? යන සැකය ඇතිවීමෙන් ථුල්ලච්චය වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). ආදී වශයෙන් සොරසිතින් වස්තු නොදීමට කූට ලෙස ක්‍රියාත්මක වීම මෙයින් අදහස් වේ. වස්තු හිමියා ස්වකීය වස්තුව මට නොලැබෙයි යන අදහසින් වස්තුව පිළිබඳ අයිතිය අතහැරිය විගස පාරාජිකා වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219).

**04. ඉරියව් වෙනස් කරවා ගැනීමය (ඉරියාපථං විකොපෙය්‍ය)**

යම් භාණ්ඩක් හෝ වස්තුවක් රැගෙන යාමේ දී ගමන් මාර්ගය ආදිය වෙනස් කර ගැනීම මෙහි අදහස වේ. ඒ සඳහා පළමු පියවර තැබීමෙන් ථුල්ලච්චය වේ. දෙවන පියවර තැබීමෙන් පාරාජිකා වේ. (සමන්තපාසාදිකා

නාම විනයට්ඨකථා I, 2014, පි. 219).

**05. වස්තුව තිබූ තැනින් ගැනීමය (ඨානා චාවෙයා)**

යම් ස්ථානයක තබන ලද වස්තුවක් සොර සිතින් ගැනීම මෙම අවහාරයෙන් කියවේ. ඨානා චාවෙයා යන්නෙහි ඨානා යනු වස්තුව තිබෙන ස්ථානයයි. චාවෙයා යනු ඉවත් කිරීමයි. (චු, චවනෙ) චුත කිරීම, තිබුණු ආකාරයෙන් ඉවත් කිරීම, යම් වස්තුවක් තිබෙන ස්ථානයේදී ම සොර සිතින් ඉවත් කිරීම, ගැනීම ඨානා චාවනය නම් වේ. එකී වස්තුව සොර සිතින් අතගෑම දුක්කට වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). එම වස්තු තිබූ ස්ථානයෙන් සෙලවීම ථුල්ලච්ච වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). වස්තුව තිබෙන ස්ථානයෙන් නො එසවීම මෙයින් අදහස් වේ. වස්තු තිබෙන ස්ථානයෙන් ගැනීම පාරාජිකා වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). වස්තුව තිබෙන ස්ථානයෙන් ඉවත් කිරීම මෙම අවහාර සිදු වීමට හේතු වේ.

**ඒකභණ්ඩ පඤ්චකය**

ඒකභණ්ඩ පඤ්චකය ආදියෙයා, හරෙයා, අවහරෙයා, ඉරියාපථං විකොපෙයා හා ඨානා චාවෙයා යන අවහාර ක්‍රියාත්මක වන්නේ සවිඤ්ඤාණික සත්වයෙකු කෙරෙයි. ''එකභණ්ඩවසෙන සස්සාමිකං දාසං වා තිරච්ඡානං වා යථා වුත්තනයෙන'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). දාසයෙක් හෝ තිරිසන්ගත සත්වයෙකු රැගෙන යාමේ දී සිදු වන අවහාර මෙයින් අදහස් වේ.

**සාහත්ථික පඤ්චකය**

තමාව මුල් කොට ගෙන සිදු වන අවහාර සාහත්ථික අවහාර නම් වේ. අන්‍ය සතු වස්තුව සියතින් ගැනීම නිසා සාහත්ථික වේ. (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014: පි. 219). මෙම පඤ්චකය සාහත්ථික පඤ්චකය නමින් නම් කොට ඇත්තේ මෙහි ඇති අවහාර අතර පළමුව ඇති සාහත්ථික අවහාරය සලකාය. ''සාහත්ථික පඤ්චකන්ති ආදි පදවසෙන නාමලාභො දට්ඨබ්බො'' (විමතිවිනොදනී, 1935, පි, 146).

**01. සාහත්ථිකාවහාරය (සාහත්ථිකො)**

සාහත්ථිකාවහාරය තමාගේ අතින් සිදු වන නිසා සාහත්ථික නම් වේ. ''සකො හත්ථො සාහත්ථිකො'' (විමතිවිනොදනී, 1935, පි, 146). අන්‍යයන්ගේ වස්තුව සොරසිතින් සියතින් ගැනීම (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). සාහත්ථිකාවහාර නම් වේ. පාදයක වටිනාකමක් හෝ ඊට වැඩිය අගයක් ඇති වස්තුවක් වෙනත් කෙනෙකුගේ ආධාර උපකාර නො මැතිව සියතින් ම සොර සිතින් ගැනීම සාහත්ථික අවහාර වේ.

**02. ආණත්තිකාවහාරය (ආණත්තිකො)**

යම් අයෙකු යොදවා සොරකම් කිරීම ආණත්තික නම් වේ. එනම් සොරකම් කිරීමට අණ කිරීමයි. අසුවලාගේ වස්තුව රැගෙන එව ආදී වශයෙන් අණ කිරීමයි. ''ආණත්තියා නිබ්බත්තො අවහාරො ආණත්තිකො'' (සාරත්ථදීපනී i, 1914, පි, 498). අණ පිළිග ත්නා පාදයක් හෝ ඊට වඩා වැඩි වස්තුවක් සොරකම් කළේ නම් අණ කළ භික්ෂු ඒ මොහොතේ ම පාරාජිකා වේ. ''තත්ථ සචෙ පරො අන්තරායිකො හුත්වා තං අවහරති ආණාපකස්ස ආණත්තික්ඛණෙයෙව පාරාජිකං'' (සාරත්ථදීපනී i, 1914, පි, 498).

**03. නිස්සග්ගියාවහාරය (නිස්සග්ගියො)**

බඳු ගන්නා ස්ථානවලට බඳු නොගෙවා සිටීම නිස්සග්ගියාවහාර නමින් හඳුන්වයි. ''නිස්සජ්ජනං නිස්සග්ගො'' (සාරත්ථදීපනී ස, 1914, පි, 498). රාජ්‍ය මට්ටමින් යම් යම් බඳු මුදල් විවිධ කාර්යයන් සඳහා ගෙවිය යුතු ද ඊට වංචා නො කළ යුතුය. ''නිස්සග්ගයො නාම අන්තොසුඞ්කඝාතෙ

ධීතො බහි සුඞ්කඝාතං පාතෙති'' බඳු ගන්නා ස්ථානයේ ඇතුළත සිට බදුගන්නා ස්ථානයේ පිටතට යම් වස්තුවක් විසිකිරීම මෙයින් අදහස් වේ. එම වස්තුව පාදයක් හෝ ඊට වඩා වැඩි නම් පාරාජිකා වේ. බැංකු ගිණුම් ආදී වශයෙන් වර්තමාන භාවිතයට මෙම නිස්සග්ගියාවහාර ගලපා ඉන් ආරක්‍ෂා වීම වැදගත්වේ.

## 04. අත්ථසාධකාවහාරය (අත්ථසාධකො)

යම් දවසක අසුවල් භාණ්ඩය සොරකම් කරන්නයැයි අණ කිරීම අත්ථසාධකාවහාර නම් වේ. අත්ථසාධකො නාම අසුකං නාම භණ්ඩං යදා සක්කොසි, තදා අවහරොති ආණාපෙති (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). සොරකම් කිරීමට දිනයක් වේලාවක් ස්ථානයක් නො කියා අණ කිරීමයි. අණ කරන්නා අණ කළ මොහොතේ පාරාජිකාවට පත් වේ. තත්ථ සචෙ පරො අනන්තරායිකො හුත්වා තං අවහරති, ''ආණාපකො ආණාත්තික්ඛනෙයෙව පාරාජිකො හොති'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 19). සොරකමට පෙර අණ කිරීමේ අවස්ථාවේ දී ආපත්තිය සිදු වන නිසා අත්ථසාධක නම් වේ. ''කිරියා සිද්ධිතො පුරෙතරමෙව පාරාජිකාපත්තිසඞ්කාතං අත්ථං සාධෙතීති අත්ථසාධකො '' (විමතිවිනොදනී, 1935, පි, 147). සොරකම් කරන්නා උපසම්පන්නයකු නම් සොරකම් කරන මොහොතේ පාරාජිකාවට පත් වේ. ''අවහාරකො පන ආවහට කාලෙ'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). අත්ථසාධකාවහාරය හා ආණත්තිකාවහාරය සමාන සේ පෙනුන ද මෙහි ඇති වෙනස වන්නේ සොරකම සිදු කරන කාලය අත්ථසාධකාවහාරයේ දී නිශ්චිත නො වීමයි. ආණත්තිකාවහාරයේ දී ඒ මොහොතේ ම සොරකම සිදු කිරීමයි (විමතිවිනොදනී, 1935, පි, 147). මෙම අවහාර දෙකේදී ම අණ කිරීම සිදු වුව ද එකී සොරකම සිදු වන්නේ ආකාර දෙකකටය. එය මෙම අවහාර දෙක අතර වෙනස වේ.

## 05. ධුරනික්ඛෙපාවහාරය (ධුරනික්ඛෙපො)

ධුරනික්ඛෙප යනු තමාගේ වස්තු පිළිබඳ වීර්ය, උත්සාහය හා බලාපොරොත්තුව අත්හැරීමයි. ධුර යන පදයෙහි අර්ථය වන්නේ වීර්ය යන්නයි. ස්වකීය වස්තුව පිළිබඳ ඇති වූ ගැටලුවක දී වස්තු හිමියාට සිය වස්තුව නොලැබේවි යනුවෙන් සිතා එය ලබා ගැනීමේ වීර්ය, උත්සාහය අත්හැරීම මෙහි අදහසයි. ''ධුරනික්ඛෙපො පන උපනික්ඛිත්තභණ්ඩවසෙන වෙදිතබ්බොති'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). යම් වස්තුවක් පිළිබඳ බොරු නඩු කියා වස්තුව අත්කර ගත්ත ද වස්තු හිමියා එය ලබා ගැනීමේ වීර්ය අත්හලේ නම් බොරු නඩු කියූ අය පාරාජිකාවට පත්වේ. ධුරනික්ඛෙපය විවිධ පැතිකඩ ඔස්සේ භික්‍ෂු ජීවිතයට අදාළ වේ. ආරාම, වතු, ණයට ගත් දෙයක්, (විමතිවිනොදනී, 1935, පි, 147). ආදී කාරණාවලදී භික්‍ෂුව විමසිලිමත් විය යුතු වේ.

## පුබ්බපයෝග පඤ්චකය

## 01. පුබ්බපයෝගාවහාරය (පුබ්බපයොග)

සොරකමට අණ කිරීම වශයෙන් පුබ්බපයෝගාවහාර හැඳින්වේ. ''පයොගෙන සහ වත්තමානො අවහාරො පුබ්බපයොගාවහාරො'' (සාරත්ථදීපනී i, 1914, පි. 498-499). පූර්වයෙන් සිදු කරන අණ කිරීම නිසා මෙම අවහාරය පුබ්බපයෝග නම් වේ. අන්තරායිකෙන ගන්හන්තස්ස අසුකස්ස භණ්ඩං ගහණතො පුබ්බත්තා පුබ්බපයොගො (සාරත්ථදීපනී i, 1914, පි. 498). අසවල් කෙනාගේ භාණ්ඩය සොරකම් කරන්න යැයි අණ කරන්නා ඒ මොහොතෙහි ම පාරාජිකා වේ. සොරකම කරන්නේ උපසම්පදා භික්‍ෂුවක් නම් ඔහු සොරකම් කරන අවස්ථාවේ පාරාජිකා වේ. පුබ්බපයෝගාවහාරය ආණත්තිකාවහාරයට සමාන වේ. නාමය පමණක් පඤ්චක දෙකේ දී වෙනස්ව යෙදී ඇත.

### 02. සහපයෝගාවහාරය (සහපයොගො)

යම් වස්තුවක් සොරකම් කිරීම නැමති ප්‍රයෝගයට උත්සාහ කිරීමත් සමග සිදුවන්නේ සහපයෝගාවහාරයයි තිබෙන ස්ථානයෙන් ඉවත් කිරීම. ඨානාචාවන වසෙන සහපයොගො (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). යම් වස්තුවක් තිබෙන ස්ථානයෙන් ඉවත් කිරීම හෙවත් සොරකම් කිරීම සඳහා භාවිත ප්‍රයෝගය ''පයොගෙන සහ වත්තමානො අවහාරො සහපයොගොති ආහ'' (විමතිවිනොදනී, 1935, පි. 147). අන්‍යයන් සතු ඉඩම් ආදියෙහි මායිම් වෙනස් කිරීම ආදියත් සහපයෝගයට ම අන්තර්ගත වේ.

### 03. සංවිදාවහාරය (සංවිධාවහාරො)

සංවිධානය වී ගොස් සොරකම් කිරීම සංවිධාවහාරයයි. ''අසුකං නාම භණ්ඩං අවහස්සාමාති සංවිදහිත්වා සම්මන්තයිත්වා අවහරණං සංවිධාවහාරො'' (සාරත්ථදීපනී i, 1914, පි. 499). බොහෝ පිරිසක් සංවිධානය වී එක් අයෙකු සොරකම කළ කල්හි සියල්ල පාරාජිකා වේ. ''සංවිදාහාරො නාම සංවිදහිත්වා එකො භණ්ඩං අවහරති, ආපත්ති සබ්බෙසං පාරාජිකස්ස'' (පාරාජිකපාළි, 2005, පි. 118).

### 04. සඞ්කෙතකම්මං

පෙරවරු කාලයේ හෝ දහවල් කාලයේ හෝ සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ හෝ සොරකම නියම කොට ගෙන සිදු කිරීම සංකේතකම්ම නම් වේ. කාලය ආදිය නියම කොට ප්‍රකාශ කිරීම දුක්කට වේ. නියම කොට කාලයෙහි වස්තුව සොරකම් කිරීම අණ කරන්නාත් සොරකම් කරන්නාත් යන දෙදෙනා ම පාරාජිකා වේ. යම් හෙයකින් නියම කරගත් කාලය වරදවා සොරකම් කළේ නම් අණ කරන්නා අනාපත්ති වන අතර සොරකම් කරන්නාට ආපත්ති වේ (පාරාජිකපාළි, 2005, පි. 118).

### 05. නිමිත්තකම්මං

යම් නිමිත්තක් පදනම් කොටගෙන සොරකම් කිරීම නිමිත්තකම්මං නම් වේ. ඇසින් හෝ ඇහි බැමෙන් හෝ හිසින් හෝ අංග චලන වශයෙන් යම් වස්තුවක් සොරකම් කිරීමට සැලැස්සවීමයි. එසේ අංග චලනයට අනුව සොරකම සිදු කරන්න යයි කීම දුක්කට වේ. එකී අංග චලනයට අනුව සොරකම සිදු වූ යේ නම් අංග චලනය සිදු කරන්නාත් සොරකම සිදු කරන්නාත් යන දෙදෙනාම පාරාජිකා වේ. අංග චලනයට පෙර හෝ පසුව සොරකම සිදු වූයේ නම් අංග චලනය කරන්නා අනාපත්ති වන අතර සොරකම සිදු කරන්නා ආපත්තියට පත් වේ. (පාරාජිකපාළි, 2005, පි. 118).

### ථෙය්‍යාවහාර පඤ්චකය

සොරාගේ ස්වභාවය සොරකම් කිරීමයි. ඒ නිසා සොරකම් කිරීමේ ස්වභාවය පදනම් කොට ගෙන ථෙය්‍යාවහාර දක්වා තිබේ. ''ථෙනො වුච්චති චොරො, තස්ස භාවො ථෙය්‍යං, තෙන අවහරණං ථෙය්‍යාවහාරො'' (සාරත්ථදීපනී i, 1914, පි. 499).

### 01. ථෙය්‍යාවහාරය (ථෙය්‍යවහාරො)

දහවල් කාලයේ හෝ රාත්‍රී කාලයේ හෝ ගෙවල් බිඳින සොරු මෙන් නොපෙනෙන සේ ගෙවල් බිඳ අන් සතු වස්තුව සොරකම් කිරීම ථෙය්‍යාවහාර නම් වේ. ''යො කොචි සස්සාමිකං භණ්ඩං රත්තිභාගෙ වා දිවසභාගෙ වා සන්ධිඡෙදනාදීනි කත්වා අදිස්සමානො අවහරති'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 272). එසේ ම කිරීම් මැනීම්වලදී තමාට ලාභ වන සේ අන්‍ය වස්තු සොරා ගැනීමත් මෙම අවහාරයට ම අදාළ වේ. ''කූටමානකූටකහාපණාදීහි වා වඤ්චෙත්වා ගණ්හාති, තස්සෙව ගණ්හතො අවහාරො'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 272). මෙම නිදසුන් පමණකි. මේ හා සම්බන්ධ එබඳු කාරණා ථෙය්‍යාවහාර වේ.

### 02. පසය්හාවහාරය (පසය්හාවහාරෝ)

යම් කෙනෙකු බිය ගන්වා මැඩ පවත්වා බලහත්කාරකම් කිරීම හා තර්ජනය කොට ඔහු සන්තක වස්තු ගැනීම පසය්හාවහාර නම් වේ. ගම් බිම් පැහැර ගන්නා සොරු මෙන් හිමියන් බිය ගන්වා බලහත් කාරයෙන් වස්තුව පැහැරගැනීම මෙයින් අදහස් වේ. ''පසය්හ අභිභවිත්වා අවහරණං පසය්හාවහාරෝ, යො හි පසය්හ බලහක්කාරෙන පරෙසං සන්තකං ගණ්හාති ගාමඝාතකාදයො විය, අත්තනො පත්තබලිතො වා වුත්තනයෙන අධිකං ගණ්හාති රාජභටාදයො විය, තස්සෙවං ගණ්හතො අවහාරො පසය්හාවහාරෝ'' (සාරත්ථදීපනී i, 1914, පි. 499). රාජ භටයන් හට අය කර ගැනීමට නියම වූ අය බදුවලට වඩා වැඩියෙන් අය බදු ගන්නා සේ අන්‍යයන්ගේ වස්තුව බලහත්කාරයෙන් ගැනීම පසය්හාවහාර වේ.

### 03. පරිකප්පාවහාරය (පරිකප්පාවහාරෝ)

උපසම්පදා භික්ෂුවක විසින් සොරා ගන්නා වස්තු පිළිබඳ කල්පනා කොට, ඒ පිළිබඳ විවිධ පැතිකඩ සිතා අන් සන්තක වස්තුව සොරකම් කිරීම පරිකප්පාවහාරය නම් වේ. ''පරිකප්පෙත්වා ගණ්හතො පන අවහාරො පරිකප්පාවහාරෝ වුච්චති, සො භණ්ඩපරිප්පනඔකාසපරිප්පන වසෙන දුවිධො'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 272). පරිකප්පාවහාර දෙයාකාරයකට සිදු වේ. භාණ්ඩපරිකප්ප හා ඔකාසපරිකප්ප වශයෙනි. තමා අපේක්ෂා කළ භාණ්ඩය නම් ගන්නෙම් එසේ නොවන්නේ නම් නොග න්නෙම් යනුවෙන් සිතා අන්සතු වස්තුව ගැනීම භාණ්ඩපරිකප්ප නම් වේ. යම් ස්ථානයක් සලකා එකී ස්ථානයට ගොස් අදාළ වස්තුව ගත් කල්හි කවරෙකු හෝ එය දුටුවහොත් බැලීමට ගත් දෙයක් වශයෙන් තබා යැමත් එය නොදුටුව හොත් රැගෙන යාමත් ඔකාසපරිකප්පය නම් වේ.

### 04.පටිච්ඡන්නාවහාරය (පටිච්ඡන්නාවහාරෝ)

යම් වස්තුවක් හිමියාට නොපෙනෙ ආකාරයට වසා තබා හෝ සගවා තබා ගැනීම පටිච්ඡන්නාවහාර නම් වේ. ''පටිච්ඡාදෙත්වා පන අවහරණං පටිච්ඡන්නාවහාරෝ'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 273). යම් ස්ථානය තිබෙන වස්තුවක් පසුව සොරකම් කිරීමේ චේතනාවෙන් වස්තු හිමියාට නොපෙනෙන සේ සැඟවීම පටිච්ඡන්න නම් වේ. සගවා නො ගත්තේ අවහාරය නොවේ. ''තස්ස එත්තාවතා උද්ධාරෝ නත්ථීති න තාව අවහාරො හොති'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 273). එසේ වස්තු හිමියා ස්වකීය වස්තුව සොයා නො ලැබුණ ද එහි ආලය සහිතව ගිය කල්හි ගත්තේ ද පාරාජිකා වේ. ''සාලයා එව ගතා හොන්ති, අථස්ස තං උද්ධරතො උද්ධාරෙ පාරාජිකං'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 273). වස්තුව වසන කාලයෙහි තමාගේය යන සංඥාවෙන් හෝ පංසුකූල සංඥාවෙන් හෝ වස්තුව හැරදමන ලද්දේය යන චේතනාවෙන් ගැනීම භණ්ඩදෙය්‍ය වේ.

### 05. කුසාවහාරය (කුසාවහාරෝ)

චීවර ආදිය සාධාරණ භෝග වශයෙන් බෙදා දීමෙ දී කුසපත් ඇදිමේ දී සිදු කරන සොරකම කුසාවහාරයට නම් වේ. කුසං කඩ්කාමෙත්වා පන අවහරණං කුසාවහාරෝ වුච්චති (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 274). චීවර ආදී යම් ආමිසයක් එකතු කොට බෙදා දීමේ දී එහි සාධාරණ බව සඳහා කුසපත් අදිනු ලැබේ. එහිදී තමාට වැඩි ලාභයක් අපේක්ෂාවෙන් කුසපත් ඇදීම අසාධාරණ ලෙස සිදු කිරීම තුළින් මෙම අවහාර සිදු වේ.

## සොරකමේ විනිශ්චය

අදින්නාදාන පාරාජිකාව පත්වීම සඳහා බලපානු ලබන්නා වූ කරුණු පහකි. මෙම කරුණු පිළිබඳ අවධානයෙන් යුක්තවීම අදින්නාදාන පාරාජිකාව විනිශ්චයේ දී වැදගත් වේ.

1. මිනිසෙකු සතු නුදුන් වස්තුවක් වීම
2. 'අන් සතු ය' යන හැඟීම
3. පාදයක් වටිනා වස්තුවක් වීම
4. ථෙය්‍ය චිත්ත (සොර සිත) පැවතීම
5. පස් විසි අවහාර අතුරින් යම් අවහාරයක් සිදු වීම

මෙම අඞ්ග සම්පූර්ණ වීමෙන් ම භික්‍ෂුව පාරාජිකා වේ. අදින්නාදාන පාරාජිකාව විනිශ්චයේ දී වැදගත් වන කරුණු පහක් සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ සඳහන් වේ.

1. වත්‍ථු - වස්තු යනුවෙන් මෙහි දැක්වෙන්නේ සොරකම හා සම්බන්ධ භාණ්ඩය හෙවත් වස්තුවයි. ''වත්ථුන්ති භණ්ඩං'' (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 219). සොරකම් කළ වස්තුවට හිමිකාරයෙක් සිටින නොසිටින බව විමසා බැලිය යුතුය. හිමිකරුවෙක් සිටී නම් ඔහු එකී වස්තුව පිළිබඳ හිමිකාරිත්වය අපේක්‍ෂා සහිතව සිටී ද එසේ නොවන්නේ නම් අපේක්‍ෂා රහිතව සිටීදැයි විමසා බැලිය යුතුය. වස්තු හිමියා වස්තුව පිළිබඳ අපේක්‍ෂා සහිත නම් ආපත්තිය සිදු වේ. ඒ පිළිබඳ අපේක්‍ෂා රහිත නම් ආනාපත්ති වේ. ඒ සඳහා විනය අට්ඨකථාවේ දැක්වෙන කථාපුවත මෙහි දී වැදගත් වේ. භාතිය රජුගේ කාලයේ එක් භික්‍ෂුවක් රියන් හතක් දිග රෙදි කැබැල්ල අංශයෙහි දමාගෙන මහාචෛතිය පූජාව සඳහා දකුණු දිශාවෙන් පැමිණියේය. ඒ අවස්ථාවේ රජු ද මහාචෛතිය වන්දනාව සඳහා පැමිණි බැවින් මහජන තෙරපුමක් ඇති විය. ඒ අවස්ථාවේ අංශයෙහි තිබූ චීවර කැබැල්ල බිම වැටුණු බවක් නොදැන භික්‍ෂුව මහාචෛතියස්ථානයෙන් නික්ම ගියේය. රෙදි කැබැල්ල වැටී ඇති බව දැනගත් භික්‍ෂුව කල්පනා කරන්නේ මෙවන් මහජන තදබදක් ඇති වෙලාවක සොයා ගැනීම පහසු නොවන බව නිසා රෙදි කැබැල්ල පිළිබඳ ධුරනික්ඛේපය සිදු කළේය. පසුව පැමිණි වෙනත් භික්‍ෂුව ඒ රෙදි කැබැල්ල දැක සොරසිතින් ගත්තේය. එයින් තමා භික්‍ෂුත්ව නැති කරගත්තේයැයි සිතා පසුව විපිළිසර බවට පත් විය. ඒ භික්‍ෂුවට උපැවිදි වීමට සිත් වුවත් විනයධරයකුගේ සමීපයෙහි විසඳාගන්නේ නම් සුදුසු යැයි සිතා මහාවිහාරවාසී සියලු පර්යාප්තිධාරී විනය ආචාර්යවරුන්ට ප්‍රමුඛ වූ චූලසුමන හිමියන් සමීපයට ගියේය. මහජන තදබදය පහව ගිය විට සිවුරු කඩ ගත් බව දත් විනයධාරී හිමියන් රෙදි කඩ අයිති භික්‍ෂුව කැදවාගෙන එන ලෙස ප්‍රකාශ කරන ලදී. රෙදි කැබැල්ල අයිතිව තිබූ භික්‍ෂුව හා එය සොරාගත් භික්‍ෂුව යන දෙදෙනා අභිමුඛයේ විනය විනිශ්චය සිදු කරන ලදී. සිවුරු කඩ අයිති භික්‍ෂුව සිදු කළ ධුරනික්ෂේපය හේතුවෙන් සොරකම් කළ භික්‍ෂුව පාරාජිකාපත්තියට පත් නොවීය. විනය විනිශ්චයේ ප්‍රකාශ වන්නේ සචෙ තෙ සුද්ධචිත්තෙන ගහිතං ගහිතං අභවිස්ස, අනාපත්තියෙව තෙ අස්ස, ථෙය්‍ය චිත්තෙන ගහිතත්තා දුක්කටං ආපන්නොති (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 220). පිරිසිදු සිතින් එකී සිවුරු කැබැල්ල ගත්තා නම් ආපත්ති නොවන බවත් සොර සිතින් ගැනීම නිසා දුක්කට බවත් මෙහි දී විනිශ්චය වේ. මෙම විනිශ්චයේ දී වස්තුව පිළිබඳ ඇති ආලය හෙවත් අපේක්‍ෂාව පිළිබඳ බැලීමෙහි වැදගත්කම පැහැදිලි වේ. චූළසුමන හිමියන්ගේ අනුශාසනාව වන්නේ දුක්කට දේශනා කොට අනාපත්ති වන ලෙසයි. එසේම සොරකම් කළ රෙදි කැබැල්ල තමා සතු කොට හිමියාට දෙන ලෙසයි.

ඉදඤ්ච කාසාවං අත්තනො සන්තකං කත්වා එතස්සෙව භික්ඛුනො දෙහිතී (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 220). මෙහිදී සිදු කරන ප්‍රකාශනය වන්නේ සොරකම් කළ භික්ෂුවට තමාගේ අයිතියට ගෙන හිමියාට ලබාදෙන ලෙසයි. එසේ කිරීමෙන් සිදු වන්නේ දෙදෙනාටම වස්තුව පිළිබඳ සැක නැති කිරීම සඳහාය. ඉදං උභින්නම්පි කුක්කුච්චවිනොදනත්ථං වුත්තං (විමතිවිනොදනී, 1935, පි. 147). චීවර කැබැල්ල හිමි භික්ෂුවට ''මම ධුරනික්ඛේපය කළ නිසා නැවත මෙම චීවර කැබැල්ල ගැනීම නුසුදුසු වේ'' යනුවෙන් සැකය ඇති වේ. (සාරත්ථදීපනී ස, 1914, පි. 499). අවහාරක භික්ෂුවට මා සන්තක නොවූ දෙයක් හිමිකාර භික්ෂුවට දුන් නිසා භණ්ඩදෙය වන්නේය. (සාරත්ථදීපනී ස, 1914, පි. 499). යනු චීවර කැබැල්ල හිමිකාරක භික්ෂුව හා අවහාරක භික්ෂුව යන දෙදෙනා තුළ ඇති වන්නා වූ කුකුස නැති වේ.

2. කාල - වස්තුව සොරකම් කළ කාලය නිර්ණය කළ යුතුය. කාලොති අවහාරකාලො (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 220). භාණ්ඩ යම් කාලයකදී මිළ වැඩි වන අතර තවත් කාලයකදී මිළ අඩු වේ. රන් අගය කලින් කලට වෙනස් වන නිසා සොරකම් කළ කාලයට අනුව එදින පවතින රන් මිළ ගණනය කළ යුතු බැවින් කාලය පිළිබඳ නිවැරදිව සොයා බැලිය යුතුය. සෙරකම සිදු වූ කාලය අනුව ආපත්ති නිශ්චය කිරීම මෙහි කාර්ය වේ.

3. දේස - සොරකම සිදු වූ යේ කුමන දේශයක ද යන්න බැලීම. දෙසොති අවහාර දෙසො (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 220). සොරකම සිදු වූ දේශයේ දී වස්තුවේ වටිනාකම කොතෙක්ද? යන්න බැලීම අවධාරණය කිරීමට විනය අට්ඨකථාවේ කථා පුවතක් දැක්වේ. අන්තර සමුද්‍රයෙහි දී එක් භික්ෂුවකට හොඳ හැඩක් ඇති පොල් ගෙඩියක් ලැබ එය ලියවන පට්ටලයකට දමා හක්ගෙ ඩියකින් නිම වූ තලියක් හා සමාන පැන් පානයට මනහර වූ තාලියක් සාදාගත්තේය. එකී තාලිය එම ස්ථානයේ තබා සෑගියට එම භික්ෂුව ගියේය. අන්තර සමුද්‍රයේ වූ ඒ විහාරයට වෙනත් භික්ෂුවක් ගොස් ඒ පැන් තාලිය දැක සොර සිතින් ගෙන එය රැගෙන සෑගිරියට ම ගියේය. ඒ පැන් තාලියෙන් කැඳ පානය කරන අවස්ථාවක එහි හිමිකාර භික්ෂුව විමසා සිටින්නේ මේ පැන් තාලිය කොහෙන් ලැබුවේද? යනුවෙනි. අවහාරක භික්ෂුව ප්‍රකාශ කරන්නේ අන්තර සමුද්‍රයෙන් ලද බවයි. එම පැන් තාලිය ඔබ වහන්සේට අයත් දෙයක් නොවන බවත් සොරෙන් ගන්නා ලද්දක් බවත් පවසමින් සඟ මැද ප්‍රකාශ කළේය. මේ පිළිබඳ විනිශ්චය සඳහා ඒ භික්ෂූහු මහාවිහාරයට ගියහ. විනයෙහි දක්ෂ වූ ආභිධම්මික ගෝදත්ත හිමියන් එහි දී පොල් ගෙඩිය ලද දේශයේ වටිනාකම විමසා විනිශ්චය කළේය. යම් දේශයක භාණ්ඩයක් මිළ අවම වන අතර තව දේශයක එකී භාණ්ඩයම මිළ අධික වේ. තුළින් එකී දේශයේ භාවිත රන් මිළ කොතෙක්දැයි සොයා ගත යුතුය.

4. අග්ඝ - සොරකම් කළ වස්තුවෙහි වටිනාකම හෙවත් අගය පිළිබඳ බැලීම අග්ඝ නම් වේ. අග්ඝො භණ්ඩග්ඝො (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 221). අලුත් භාණ්ඩයක අගය වැඩිවන අතර එය ම පැරණි වීමෙන් අගය අඩු වේ. සමහර වස්තු පැරණි වීමේදී අගය වැඩි වන ස්වභාවයක් ද ඇත්තේය. එම වස්තුව පාදය හෝ අතිරේක පාදයක් වටින්නේ දැයි නිවැරදි ආකාරයට ගණනයක කළ යුතුය.

5. පරිභෝග - සොරකම් කළ වස්තු හිමිකරු විසින් පරිභෝග කළ නො කළ බව බැලීම පරිභෝග නම් වේ. පරිභොගොති භණ්ඩපරිභොගො (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 221). සමහර භාණ්ඩ පරිභෝග කළ කල්හි වටිනාකම අඩු වන බැවිනි. භාණ්ඩ මිළට ගත් අවස්ථාවේ

පැවති වටිනාකමින් නොමැනිය යුතු බව භාණ්ඩ පරිභෝගය අනුව සැලකිය යුතුය. පිහියක් වගේ භාණ්ඩක් නම් යම් ආකාරය දෙයක් කැපීම, පිහිය මුවහත් කිරීම ආදිය සිදු කොට ඇත් නම් එය පරිභෝග කළ භාණ්ඩයක් වශයෙන් සලකයි. චීවරයක් නම් නොපොරවන ලද නමුත් අංශයේ හෝ හිසේ දමාගත් කල්හි එය පරිභෝග යට වැටේ. මෙම ආකාරයට භාණ්ඩයේ පරිභෝගය විමසා බැලිය යුතුය.

මෙම කරුණු පහෙන් ම වස්තුවේ අගය පිළිබඳ විමසා බැලීම සිදු වේ. අදින්නාදාන පාරාජිකාවට වස්තුව පිළිබඳ නිවැරදි විනිශ්චයක් ලැබිය යුතු බැවින් විවිධ මානයන් ඔස්සේ සිදු කරන්නේ එහි අගය පාදයක් තරම් වටී ද එසේ නොවන්නේ ද යන්න බැලීමයි. ඒ අනුව ඊට ආපත්තිය නිශ්චය කරයි.

## අනාපත්ති

ආපත්තියට නැංවීමට පෙර අනාපත්ති වාරය පිළිබඳ දැනගැනීම වැදගත් වේ. අනාපත්ති සසඤ්ඤිස්ස, විස්සාසග්ගාහෙ, තාවකාලිකෙ, පෙතපරිග්ගහෙ, තිරච්ඡානගතපරිග්ගහෙ, පංසුකූලසඤ්ඤිස්ස, උම්මත්තකස්ස, ඛිත්තචිත්තස්ස, වෙදනාවට්ටස්ස, අදිකම්මිකස්සාති (පාරාජිකපාළි, 2005, පි. 124). වස්තුව තමා සන්තකය යන අදහස ඇත්තාට, විශ්වාසයෙන් ගත් තැනැත්තාට, තාවකාලික සංඥාව ඇත්තාට, ප්‍රේතයන් සතු වස්තුව, තිරිසන් සතුන්ට හිමිකාරීත්වය ඇති කල්හි, පංසුකූල සංඥාවෙන් වස්තු ගත් කල්හි, උම්මත්තකයාට, වික්ෂිප්ත සිත් ඇත්තාට, වේදනාවෙන් පෙලෙන්නාට, ආදිකම්මිකයාට ආදී අයට අදින්නාදාන පාරාජිකාපත්තිය සිදු නොවේ. යම් වස්තුවක් පිළිබඳ ආපත්ති විනිශ්චයට පෙර අනාපත්තිවාරය පිළිබඳ බැලීම වැදගත් වේ.

## පාරාජිකා උපමාව

අදින්නාදාන පාරාජිකාව සිදු වීමෙන් උපසම්පදා භික්ෂුවට සිදු වන ආපත්තිය පැහැදිලි කිරීම සඳහා දක්වා ඇති උපමාව වැදගත් වේ. එහි දී ශාසනික හිමිකාරීත්ව අහිමි වන ආකාරය පැහැදිලි කරන්නේ මෙසේය. ''පාරාජිකො හොතීති සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො බන්ධනා පවුත්තො අභබ්බො හරිතත්තාය එවමෙව භික්ඛු පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිත්වා අස්සමනො හොති අසක්‍යපුත්තියො, තෙන වුච්චති පාරාජිකො හොතීති'' (පාරාජිකපාළි, 2005, පි. 107). යම් කොළයක් නටුවෙන් ගිලිහුණු කල නැවත හරිත වර්ණයට පත්වීමට නො හැකි වන්නේ යම් සේ ද එසේ පාදයක් හෝ පාදයක් වටිනාකම් ඇති වස්තුවක් සොරකම් කළ භික්ෂුවට ශාසනික කාර්යෙහි හිමිකම් නො ලබයි. උපසම්පදා භික්ෂුවක වශයෙන් ශාසනිකව ක්‍රියාත්මක වීමේ අවස්ථාව අහෝසි වී යයි.

## නය මාතිකා

අදින්නාදාන පාරාජිකාව සඳහා නය මාතිකා 30ක් දක්වා තිබේ. අනාගතයෙහි ශාසන කාර්යෙහි නිරත පාපී අදහස් ඇති යම් භික්ෂුවක ලේශ මාත්‍ර වශයෙන් සොරකම හා සම්බන්ධ ක්‍රියාවෙන් වළකනු පිණිස නය මාතිකා දක්වා තිබේ. තං යත්ථ යත්ථ ඨිතං, තත්ථ තත්ථ ආදානං ගච්ඡති, අනාගතෙ පාප භික්ඛූනං ලෙසොකාසනිරුන්ධනත්ථං තථා තථා විත්ථාරතො දස්සෙතුං (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා I, 2014, පි. 223). සොරකම කෙසේවත් සිදු කිරීමට ඇති අවස්ථා පූර්ණ වශයෙන් වළකනු පිණිස මේ ආකාර න්‍යාය මාතෘකා දක්වා ඇති බව පෙනෙයි. භූම්මට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං උදකට්ඨං නාවාට්ඨං යානට්ඨං භාරට්ඨං ආරාමට්ඨං විහාරට්ඨං ඛෙත්තට්ඨං වත්ථුට්ඨං ගාමට්ඨං අරඤ්ඤට්ඨං උදකං දන්තපොනං වනස්පති හරණකං උපනිධි සුඞ්කඝාතං පාණො අපදං දිපදං චතුප්පදං බහුප්පදං ඔචරකො ඔනිරක්ඛො සංවිදාහාරො සංකෙතකම්මං සංවිදාහාරො (පාරාජිකපාළි, 2005, පි.

106). මෙම මාතෘකාවලින් වෙන වෙන ම සොරකම් කළ හැකි ස්ථාන ආදිය හා සොරකම් කළ විට සිදු වන ආපත්ති දක්වා තිබේ.

## සමාලෝචනය හා නිගමනය

සතර පාරාජිකා අතර සියුම් සේ විනිශ්චය කළ යුතු ආපත්තියක් වශයෙන් අදින්නාදාන පාරාජිකාව හැඳින්විය හැකිය. ආපත්තිවීමත් ආපත්ති නො වීමත් සිදු වන්නේ ඉතා සියුම් ලෙසිනි. එසේ ම උපසම්පදා භික්ෂුවක විසින් සිය ජීවිතයේ දී අදින්නාදාන පාරාජිකාවට පත්වීමේ භව්‍යතා පිළිබඳ සැලකිලි විය යුත්තේ එය සිදුවන වාරය අතිශය සියුම් වන බැවිනි. වර්තමාන ශාසනික කාර්යෙහි දී ආපත්තියට පත්වීම නො දැනුවත් ම සිදු විය හැකි බැවිනි. වර්තමාන පැවිද්ද තුළ භික්ෂුවක විසින් සොරකම් නො කළ ද රාජ්‍ය මට්ටමින් ගෙවිය යුතු අය බඳු, බිල්පත් ආදිය නො ගෙවා සිටීම මෙම ආපත්තිය බොහෝ සෙයින් හේතු කාරක විය හැකිය. මුදල් හා භාණ්ඩ මත පදනම් වී ගනු දෙනු කිරීමේ දී මෙය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. තමාගේ වාසිය අපේක්ෂාවෙන් ගණු දෙනු කරන්නෝ ද මිල දී ගැනීම් මිළ කිරීම් වැනි ක්‍රියාවන්හි දී කූට මුදලාලි ආකෘතියක සිට ක්‍රියාත්මක වන්නෝද මෙහි දී සැළකිලිමත්වීම වැදගත් වේ. පස් විසි අවහාර ක්‍රමයෙන් කුමන ක්‍රමයක් සිදු වුව ද නය මාතිකා අතුරින් කුමන නය මාතිකාවක් සිදු වුව ද ආපත්ති සිදු වේ.

උපසම්පදා භික්ෂුවක පාදයක් හෝ පාදයකට සමාන වටිනාකම් ඇති වස්තුවක් සොරකම් කිරීම පාරාජිකා වේ. රත්තරන් මංචාඩියකට අඩු වටිකාමක් ඇති වස්තුවක් නම් දුක්කට වේ. රත්තරන් මංචාඩියකට වැඩි මංචාඩි පහකට අඩු නම් ථුල්ලච්චය වේ. ආපත්ති සිදු වන ආකාරය අනුව පැවිද්ද ආරක්ෂා වන්නේ ද එසේ නොවන්නේ ද යන්න විනයානුකූලව විනිශ්චය කිරීම මෙම අදින්නාදාන පාරාජිකාපත්තියේ දී විමසා බැලිය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අරියවිමල හිමි, තල්දෙන, විමලවංශ සූර්ය, අයි.බී. සහ සිලෝගම, ටී.බී. (2023). පාලි සිංහල ශබ්දාර්ණවය, කොළඹ: සමයවර්ධන පොත්හල.

කන්තදේව, රාජා රාධ, (1967). ශබ්දකල්පද්‍රැම i, වාරාණාසි: චෞඛම්බා සංස්කෘත ග්‍රන්ථ කාර්යාලය.

තර්කවාචස්පති, තාරානාථ, (1962). වාචස්පත්‍යම් iv, වාරාණාසි: චෞඛම්බා සංස්කෘත ග්‍රන්ථ කාර්යාලය.

විමතිවිනොදනී නාම සමන්තපාසාදිකාය විනයට්ඨකථාය ටීකා, (1935). කොළඹ: ලක්ෂමන් මුද්‍රණාලය.

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා i, (1914). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණ.

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා iv, (1948). කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණ.

සාරත්ථදීපනී නාම සමන්තපාසාදිකාය විනයට්ඨකථාය ටීකා ii, (1914). කොළඹ: විද්‍යාවිභූසන යන්ත්‍රාලය.

සොරත හිමි, ඩබ්ලිව්. (1952). ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, කොළඹ: මහා බෝධි යන්ත්‍රාලය.

Apte, V.S. (1985). Sanskrit English Dictionary. Delhi: Montilal Banarsidass.

Bhikkhu Ñāṇatusita, (2014). Analysis of The Bhikkhu Pātimokkha, Kandy: Buddhist Publication Society.

Childers, R.C. (1875). A Dictionary of the Pali Language, London: Trubner and Co.

Rhys Devids, T.W. (2005). On the Ancient Coins and Measures of Ceylon, New Delhi: Asian Educatinal Service.

Rhys Devids, T.W. and Stede, Wiliam, (1925). Pali English Dictionary, London: Montilal Banrsidass Publishers Private Limied.